මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) යනු ගෝලීය දරිද්‍රතාවට විරුද්ධව කරන සටනට සහාය වන එක්සත් ජනපදයේ විදේශ ආධාර සපයන නව්‍ය හා ස්වාධීන ආයතනයකි.

ප්‍රබල ද්විපාර්ශවික සහයෝගයෙන් 2004 වර්ෂයේ එක්සත් ජනපද කොංග්‍රස් සභාව විසින් නිර්මාණය කරන ලද මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ආයතනය, යහපත් ප්‍රතිපත්ති, රටේ අයිතිය හා ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කරමින් එක්සත් ජනපදයෙන් ලබා දෙන විදේශ ආධාර පිළිබඳ කතිකාවත වෙනස් කර තිබේ.

යහපාලනය, ආර්ථික නිදහස සහ පුරවැසියන්.සඳහා අයෝජන කිරීමට කැපවූ දියුණුවන රටවල් සමග මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ආයතනය හවුල්කාරීත්ව සබඳතා ගොඩ නගා ගනී.

තිරසාර ආර්ථික වර්ධනයක් තුළින් දරිද්‍රතාවය අවම කිරීම සඳහා එම රටවලින් ක්‍රියාත්මක කරන විසඳුම් සඳහා හොඳ කාර්ය සාධනයක් ඇති රටවලට, මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන්(MCC) ආයතනය, මහා පරිමාණ ප්‍රදානයන් ලබා දෙයි. .මෙම (MCC) ප්‍රදාන සැලසුම් කර ඇත්තේ අනෙකුත් එක්සත් ජනපද හා ජාත්‍යන්තර සංවර්ධන වැඩසටහන් ඌන පූරණයට මෙන්ම පුද්ගලික අංශයේ ආයෝජන සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම සඳහා යි. මෙම (MCC) ප්‍රදානවල මූලික වර්ග තුනක් තිබේ: ඒවා නම් සම්මුති, ආරම්භක වැඩසටහන් සහ කලාපීය ආයෝජන සඳහාවූ සමගාමී සම්මුතීන් යනුවෙනි.

සම්මුති යනු දරිද්‍රතාවය අවම කිරීම සහ ආර්ථික වර්ධනය උත්තේජනය කිරීම අරමුණු කරගත් නිශ්චිත වැඩසටහන් සඳහා අරමුදල් ලබා දීම සඳහා මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන්(MCC) ආයතනය සහ සුදුසුකම් ලත් රටක් අතර අත්සන් කෙරෙන පස් අවුරුදු ගිවිසුම් වේ. ආරම්භක වැඩසටහන් යනු සම්මුති අරමුදල් සඳහා සුදුසුකම් නොලබන නමුත් ප්‍රතිපත්ති කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා දැඩි ලෙස කැපවී සිටින රටවලට ප්‍රදානය කරනු ලබන කුඩා පරිමාණ ප්‍රදාන වේ. දේශසීමා හරහා ආර්ථික ඒකාබද්ධතාව, වෙළඳාම සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා සමගාමී ගිවිසුම්වලට එළඹීමට 2018 අප්‍රේල් මාසයේදී AGOA සහ MCA නවීකරණ පනත මගින් මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ආයතනයට බලය ලබා දී ඇත.

මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන්(MCC) ආයතනය ප්‍රධාන විධායක නිලධාරියෙකු විසින් මෙහෙයවනු ලබන අතර එය නව දෙනෙකුගෙන් යුත් රාජ්‍ය-පෞද්ගලික අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් පාලනය කරනු ලැබේ. එම මණ්ඩලයේ මූලසුන දරන්නේ රාජ්‍ය ලේකම් වන අතර සාමාජිකයින් අතර භාණ්ඩාගාර ලේකම්, එක්සත් ජනපද වෙළඳ නියෝජිත, අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද (USAID) ආයතනයේ පරිපාලක, මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන්(MCC) ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී හා පුද්ගලික අංශයේ නියෝජිතයන් හතර දෙනෙක් සිටී.

## මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන්(MCC) ආයතනයේ විශේෂත්වය කුමක්ද?

මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ආයතනය යනු දියුණු වන රටවලට හා ඇමරිකානු බදු ගෙවන්නන්ට ප්‍රතිලාභ අත් කර දෙමින් එක්සත් ජනපද රජයේ ආධාර කාර්යක්ෂම ලෙස ලබා දෙන ආයතනයකට හොඳ උදාහරණයකි.

**තරඟකාරී තේරීම:** මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන හා විවිධ පෙනෙන ප්‍රතිපත්ති දර්ශක 20 ක් මත, රටක කාර්යසාධනය පරීක්ෂා කරන අතර ප්‍රතිපත්තිවල කාර්ය සාධනය මත පදනම්ව රටවල් තෝරා ගනී.

**රටවල් විසින්ම සොයා ගත් විසඳුම්:** තිරසාර ආර්ථික වර්ධනයක් සහ දරිද්‍රතාවය අවම කිරීම සඳහා ඔවුන්ගේ ප්‍රමුඛතා හඳුනා ගන්නා ලෙස තෝරා ගත් රටවලට මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන්(MCC) ආයතනය දැනුම් දෙයි. එම රටවල් ඔවුන්ගේ යෝජනා සකස් කරන්නේ ඔවුන්ගේ සමාජය සමග පවත්වන පුළුල් සාකච්ඡා තුළිනි. මෙම වැඩසටහන් වඩා දියුණු කිරීමට මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන්(MCC) ආයතනය එම රටවල් සමග සහයෝගීව කටයුතු කරයි.

**රටවල් විසින් මෙහෙයවන ක්‍රියාත්මක කිරීම:** රටකට මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) සම්මුතියක් ප්‍රදානය කළ විට, එහි සියලු අංශ කළමනාකරණය හා අධීක්ෂණය කිරීම සඳහා වගකිවයුතු දේශීය ආයතනයක් පිහිටුවයි. මූල්‍ය අධීක්ෂණ කටයුතු, දැඩි වගකීමෙන් හා පාරදෘශ්‍ය ලෙස කළ යුතු අතර බොහෝ විට මෙය සිදු කරන්නේ ස්වාධීන මූල්‍ය නියෝජිතයෙකු හරහායි.

**ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කිරීම:** හොඳ ප්‍රතිඵල ලබා දීමට සහ ඇමරිකානු ජනතාවට ඔවුන්ගේ ආයෝජනයෙන් හොඳ ප්‍රතිලාභයක් ලැබෙන බව සහතික කිරීමට මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ආයතනය කැපවී සිටී. තමන්ගේ වැඩසටහන්වල ප්‍රගතිය අධීක්ෂණය කිරීමටත් ඒවායේ බලපෑම ඇගයීමටත් මෙම (MCC) ආයතනය තාක්ෂණික වශයෙන් දැඩි, ක්‍රමානුකූල හා පාරදෘශ්‍ය ක්‍රමවේදයන් භාවිතා කරයි.

## මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන්(MCC) ආයතනය ලබන ජයග්‍රහණය කුමක්ද?

මේ වන විට මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන්(MCC) ආයතනය ලොව පුරා සම්මුති සඳහා ඩොලර් බිලියන 12.0ක්ද ආරම්භක වැඩසටහන් සඳහා ඩොලර් මිලියන 631ක්ද අනුමත කර තිබේ. මෙම ප්‍රදානයන් මගින් කෘෂිකර්මය හා වාරිමාර්ග, මූල්‍ය හා ව්‍යවසාය සංවර්ධනය, ප්‍රවාහන යටිතල පහසුකම්, දූෂණ විරෝධී වැඩසටහන්, බලශක්තිය සැපයීම, දේපළ අයිතිය හා ඉඩම් ප්‍රතිපත්තිය, ජල සැපයුම සහ සනීපාරක්ෂාව, අධ්‍යාපන සේවා ලබා ගැනීම හා සෞඛ්‍ය සේවා ලබා ගැනීම ඇතුළු බහුවිධ අංශවල ව්‍යාපෘතිවලට සහාය වේ.

**අද වන විට ලබා ඇති ප්‍රතිඵල:** ගොවීන් 404,477 ක් පුහුණු කිරීම, වාණිජ හා ප්‍රජා ව්‍යවසායන් 4,223 ට සහාය වීම සහ ඩොලර් මිලියන 87.1 ක කෘෂිකාර්මික හා ග්‍රාමීය ණය ලබා දීම, කිලෝමීටර් 3,480 මහා මාර්ග සම්පූර්ණ කිරීම, මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) අරමුදල් සපයන අධ්‍යාපන කටයුතුවලට සිසුන් 233,403 ක් සහභාගී වීම, මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන්(MCC) සහාය දුන් ක්‍රියාකාරකම් තුළින් උපදේශකයන් 5,063 ක් පුහුණු කිරීම හෝ සහතික කිරීම, අධ්‍යාපන පහසුකම් සපයන ස්ථාන 818 ඉදිකිරීම, ජලය සපයන ස්ථාන 1,191 ක් ඉදි කිරීම හා 12,386 දෙනෙකුට සෞඛ්‍යාරක්ෂාව සහ සනීපාරක්ෂක ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණුවක් ලබා දීම ආදිය වේ.

මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන්(MCC) ආයතනයේ සම්මුති හා ආරම්භක වැඩසටහන් මගින් ලෝකයේ දුප්පත්ම ජනතාවට වර්ධන අවස්ථා ප්‍රවර්ධනය කිරීම හා ජීවන තත්වය ඉහළ නැංවීම තුළින් වඩා සමෘද්ධිමත් අනාගතයක් බිහි කරයි. වැඩි විස්තර සඳහා www.mcc.gov. වෙබ් අඩවියට පිවිසෙන්න.

| සම්මුති සඳහා ඩොලර් බිලියන 12.7 ක් | |
|---|---|
| ආර්මේනියාව | මාලි |
| බෙනින් | මොල්ඩෝවා |
| බර්කිනා ෆාසෝ | මොන්ගෝලියාව |
| කැබෝ වර්ඩ් | මොරොක්කෝව |
| අයිවරි කොස්ට් | මොසැම්බික් |
| එල්සැලර්වඩෝ | නැමීබියාව |
| ජෝර්ජියාව | නේපාලය |
| ඝානාව | නිකරගුවා |
| හොන්ඩුරාස් | නයිජර් |
| ඉන්දුනීසියාව | පිලිපීනය |
| ජෝර්දානය | සෙනගාලය |
| ලෙසතෝ | වැන්සානියාව |
| ලයිබීරියාව | වනවටු |
| මැඩගස්කරය | සැම්බියාව |
| මලාවි | |

| ආරම්භක වැඩසටහන් සඳහා ඩොලර් මිලියන 631 ක් | |
|---|---|
| ඇල්බේනියාව | නයිජර් |
| බාර්කිනා ෆාසෝ | පැරගුවේ |
| ග්වාතමාලාව | පේරු |
| ගයනාව | පිලිපීනය |
| හොන්ඩුරාස් | රුවන්ඩා |
| ඉන්දුනීසියාව | සැවෝ ටෝමේ |
| ජෝර්දානය | හා ප්‍රින්සිපි |
| කෙන්යාව | සියරා ලියොන් |
| කොසොවෝ | ටැන්සානියාව |
| කිර්ගිස් | ටිමෝ-ලෙස්ටි |
| ජනරජය | උගන්ඩාව |
| ලයිබීරියාව | යුක්රේනය |
| මලාවි | සැම්බියාව |
| මෝල්ඩෝවා | |